# බළන්ගොඩ අධ්‍යාපන කලාපය
## Zonal Education – Balangoda

දෙවන වාර පරීක්ෂණය | 7 ශ්‍රේණිය
Second Term Test | Grade - 7

සිංහල භාෂාව හා සාහිත්‍යය
Sinhala Language and Literature

පැය දෙකයි
Two Hours

නම :

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර සංඛ්‍යාව වන්නේ ,
   I දහයකි   Ii පහකි   Iii තුනකි   Iv හතකි

2. මහාප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර වන්නේ ,
   I ප බ ණ ගම   Ii ෂ ධ ඔ ඝ හ   Iii ධ ඡ න ක ළ   Iv බ ථ ඵ ඣ හ

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න .
   I ප්‍රශ්න , ගැටලුව. ප්‍රස්තාර . පිළිවෙළ   Ii විමර්ශණ. ගැටලුව , ඛනිජ , ශිෂ්ටාචාරය
   Iii ප්‍රධාන , අළුයම , මහපොළව , දර් ශනය   Iv ප්‍රවීන . අනුස්මරණ , හදාරණ , සමස්ත

4. උක්ත පද පමණක් අඩංගු වරණය තෝරන්න.
   I බල්ලන් . කුරුල්ලෝ. වැද්දෙක් . අයෙක්   Ii කුරුල්ලෝ , ඔවුහු , ළමයා , මිනිසෙක්
   Iii ගවයන් . අම්මා. ළමයි, මිනිස්සු   Iv තරුණියක් . නළුවෙකු . ගායිකාවක් ,ඇය

5. විරුද්ධාර්ථ පද යුගලයක් නො වන්නේ,
   I නම්බුව = අවනම්බුව   Ii අභ්‍යන්තර = බාහිර
   Iii අවමාන = අසමාන   Iv ඇත = මැත

6. පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   I මාමා සේවකයා ලවා කඩය පිරිසිදු කරවයි   Ii තාරකා දූරකතනය අතට ගෙන පරික්ෂා කළා ය
   Iii සමන් සිනා සිසී මා දෙස බැලුවේ ය   Iv ඔහු නින්දට යද්දී වැස්ස පටන් ගත්තේ ය

පහත සඳහන් වාක්‍ය වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

7. සෙමින් ධාවනය කරන
   I උද්ගාමී   Ii මන්දගාමී   Iii ශීඝ්‍රගාමී   Iv නිගාමී

පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

8. නුඹ දිනපතා දෙමාපියන් නැමද පාසැල් .......................
   I යන්නෙහු    Ii යන්නෙහි    Iii යන්නේය    Iv යමි

9. වීරෝදාර සෙබළු රට රැකීමට පෙරට .....................
   I යති    Ii යයි    Iii යන්නහු    Iv යන්නේය

10. තුරුලතා සියලු සත්ත්වයන්ට සෙවණ ....................
   I දෙති    Ii දෙයි    Iii දෙන්නේය    Iv දෙන්නීය

11. රාජකාරි ලිපියක මූලිකාංගවලට ඇතුළත් නො වන අංගයක් වන්නේ,
   I ආශිර්වාදය    Ii ලබන්නාගේ ලිපිනය    Iii ආමන්ත්‍රණය    Iv දිනය

12. “මහ පුදුමෙකි - මලක මලෙකි” මෙහි “මලක මලෙකි” යනු
   I උපමාවකි    Ii රූපකයකි    Iii එළිසමයකි    Iv අනුප්‍රාසයකි

13. “හීල් අඩුක්කුව” යනු ...............
   I උදේ ආහාරය    Ii දිවා ආහාරය    Iii සීතල ආහාරය    Iv රාත්‍රී ආහාරය

14. සේදැරි කරනවා යනු
   I ගමන් කරනවා    Ii පයින් යනවා    Iii ඉක්මන් කරනවා    Iv තාලයට යනවා

15. පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර් ණ කිරිමට සුදුසු පදය තෝරන්න.
   බීරි අලින්ට ..................... වයනවා වගෙයි.
   I බෙර    Ii තබ්ලා    Iii ගිටාර    Iv වීණා

- දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.

16. අහස -
   I නුබ    Ii විමන    Iii පවන    Iv උවන

17. මුහුද
   I දෙරණ    Ii භුවන    Iii ගඟන    Iv සමුදුර

18. නිවැරදි ව පද බෙදා දක්වා ඇති වාක්‍ය තෝරන්න.
   I. නිවහල් දේශයක් ගොඩ නගව්.
   II. දියුණු වේ මග අනුගමනය කරව්.
   III. ජාතියේ අභි මානය සුරකිව්.
   IV. අඩි පාරවල් දිගේ ගමන් කිරීම අපහසු ය .

19. “ගස වතුසුදු - වී පිරිසුදු
පොහොය නැතිදු - සිල් ගත් බදු” - මෙහි රචකයා වන්නේ,
I එස් . මහින්ද හිමි ii ආනන්ද රාජකරුණා iii සාගර පලන්සූරිය iv මුනිදාස කුමාරතුංග

20. “මස්සෙන් දහසක්” යන්නෙහි තේරුම වන්නේ,
I මසුරන් සියයක් ii රන්කාසි දහයක් iii මසුරන් දහසක් iv රන්කාසි දසදහසක්

# ii කොටස

**පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ඔබ පන්තියේ සිසුන් එක් ව නිර්මාණය කරන ලද බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
 i. බිත්ති පුවත්පත සඳහා යෙදූ නම කුමක් ද ? ( ල. 01 )
 ii. බිත්ති පුවත්පතට ඇතුළත් කරන ලද නිර්මාණ 3ක් සඳහන් කරන්න. ( ල. 03 )
 iii. බිත්ති පුවත්පත සැකසීමේ දී ගුරුවරයාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. ( ල. 02 )
 iv. බිත්ති පුවත්පත සැකසීමේ දී ඔබට ඇති වූ ගැටලු 2ක් සඳහන් කරන්න. ( ල. 02 )
 v. මෙහි දී ඔබ ලද අත්දැකීම් 2ක් ලියා දක්වන්න. ( ල. 02 )

( මුළු ල. 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.
 i. මහමග අනතුරු වළකමු නිරතුරු.
 ii. පරිසරය රැකුණොත් අපත් රැකෙයි.
 iii. සෞඛ්‍යය පුරුදු සුරකිමු - වසංගත රෝග දුරලමු.
 iv. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යය කුමවත් ව බැහැර කරමු.
 v. සොඳුරු වන පියසක අසිරිය වින්දෙමි

( ල. 20 )

03. පහත සඳහන් කරුණු ඇසුරින් ඔබ පාසලේ පැවැත්වෙන අත්කම් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ආරාධනා කිරීම සඳහා සැකසෙන ආරාධනා පත්‍රය පිළියෙල කරන්න.

| | | |
|---|---|---|
| කාරණය | : | 7 ශ්‍රේණියේ සිසුන්ගේ අත්කම් ප්‍රදර්ශනය නැරඹීම. |
| ස්ථානය | : | තිරසරගම මහ විද්‍යාලයීය ප්‍රධාන ශාලාව. |
| දිනය | : | 2021 .10 . 15 |
| වෙලාව | : | පෙ. ව. 10.00 සිට ප. ව. 4.00 දක්වා. |
| ප්‍රධාන ආරාධිතයා | : | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා |
| සංවිධානය | : | 7 ශ්‍රේණියේ “පිපෙන කුසුම්” නිර්මාණ සංසදය ( ල. 10 ) |

04.පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උඳුවප් පසළොස්වක පෝ දා ඇරඹෙන සිරිපා වාරය වෙසක් පසළොස්වක පෝ දා අවසන් වෙයි. වෙසක් පෝ දාට පසු දින සිට උඳුවප් පෝ දාට පෙර දින දක්වා කාලය සිරිපා අවාරය යි. මාස හයක් තිස්සේ බැතිමතුන්ගේ පූජෝපහාර ලබමින් වැඩ වෙසෙන දේවාරූඪ කර සඳුන් හරයකින් නිම කරන ලද සුමන සමන් දෙවි රුව සිරිපා අවාරයේ වැඩ වෙසෙන්නේ ගල්පොත්තාවල රජමහා විහාරයේ ය.සිරිපා වාරය ආරම්භ වන්නේ සුමන සමන් දෙවි රුව පලාබද්දල හරහා වැටී ඇති රජ මාවත ඔස්සේ මහ පෙරහරින් මළුවට වැඩම වීමෙනි.

i. සිරිපා වාරය ඇරඹෙන්නේ කුමන පෝ දිනක ද ?
ii. සිරිපා අවාරය ලෙස සැලකෙන්නේ කුමන කාලය ද ?
iii. සිරිපා අවාරයේ සුමන සමන් දෙවි රුව වැඩ වසන්නේ කොහි ද ?
iv. සිරිපා වාරය ආරම්භ වන්නේ කෙසේ ද ?
v. සිංහල ක්‍රමයට උඳුවප් මාසය ලෙස සැලකෙන්නේ කුමන මාසය ද ?

( 2 x 5 = 10 )

05.පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැන් සඳහා වන පිළිතුරු වරහන් තුළින් තෝරන්න.
i. අක්කා මල් නෙළා වට්ටියට එකතු ................ ( කළේ ය / කළා ය / කළ හ )
ii. හමන මඳ ............... ගිමන නිවයි. (නල / නළ)
iii. “මගෙ සුරතල් අක්කාගේ - මාලේ මුතු ඇට වාගේ” මෙහි සඳහන් වන්නේ, (උපමාවකි / රූපකයකි )
iv. ගොවීහු රටට බත .................. (සපයයි / සපයති / සපයහු )
v. “ ක....ෂ්ඨ” මෙම වචනයේ හිස්තැනට සුදුසු අකුර වන්නේ, ( නි / ණි )

( 2 x 5 = 10)

06.පෙළපොත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i. “සිනා කුමරි” පද්‍ය පන්තියේ කතුවරයා නම් කරන්න.
ii. “ඉදිරියේ දී පාටව කෙරෙමි” මෙම උද්ධෘතය උපුටා ගත් පාඩම කුමක් ද ?
iii. “හොඳයි. මම මින් ගැලවෙන විදියක් කියන්නම්” මෙය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද ?
iv. “ජම්බු ගහට රත පොරවන්නී - බක්මී ගහ කහ අන්දන්නී
අඹ දලු ළා රත තවරන්නී - .................................”
මෙම කවිය සම්පූර් ණ කරන්න.
v. අප සතු ව පවතින පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද ?

( 2 x 5 = 10 )